**ශීර්ෂය 1 - ජනාධිපති කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂය 1 - ජනාධිපති කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 11 දින ජනාධිපති ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

ජනාධිපති කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 6,860.38 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 6,183.29 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ජනාධිපති කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 677.09 ක් හෙවත් සියයට 9.87 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 2,063.99 | 1,985.10 | 78.89 | 3.82 |
| මූලධන | 4,796.39 | 4,198.19 | 598.20 | 12.47 |
| එකතුව | 6,860.38 | 6,183.29 | 677.09 | 9.87 |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

ජනාධිපති කාර්යාලය විසින් 2016 වර්ෂය සඳහා අංක 10.02.11.00 දරන ආදායම් සංකේතය සඳහා රු. මිලියන 35,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 35,976 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 102.78 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.02.11.00 | 35,000 | 35,976 | 976 | 2.78 |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 00101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 30.00 | 29.55 | 18.00 | 18.96 | 100.00 | 59.86 |

**2.4 අග්‍රිම ගිණුම්**

2016 දෙසැම්බර් 31 දිනට ජනාධිපති කාර්යාලය යටතේ වූ අග්‍රිම ගිණුම් 02 ක එකතුව රු.මිලියන 45.77 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 7002/0000/00/0117/0014/000 | 45.76 |
| 7002/0000/00/0117/0015/000 | 0.01 |
| **එකතුව** | **45.77** |

**2.5 පොදු තැන්පත් ගිණුම්**

ජනාධිපති කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 06 ක ශේෂ එකතුව රු. මිලියන 832.32 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0020/0009/000 | 119.59 |
| 6000/0000/00/0002/0113/000 | 1.78 |
| 6000/0000/00/0013/0073/000 | 402.50 |
| 6000/0000/00/0016/0060/000 | 15.98 |
| 6000/0000/00/0018/0072/000 | 0.14 |
| 6000/0000/00/0006/0077/000 | 292.33 |
| එකතුව | 832.32 |

**2.6 විගණන නිරීක්ෂණය**

ජනාධිපති කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

ජනාධිපති කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණු අතර ගිණුම් අනුව ස්ථාවර වත්කම් වටිනාකම සහ විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම අතර රු. මිලියන 26.63 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3.2 අයවැය විචලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ජනාධිපති කාර්යාලයේ 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, 2016 වර්ෂය තුළදී පරිපූරක ඇස්තමේන්තු මගින් එම කාර්යාලය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සැසඳීමේදී, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණය, අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 20 සිට සියයට 1,936 ක පරාසයක පැවතුණි.

(ආ) 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව, වැය විෂයන් තුනක් සඳහා වූ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය ශුන්‍ය අගයක් ගෙන තිබුණද, පරිපූරක ඇස්තමේන්තු මගින් එම වැය විෂයන් සඳහා රු. මිලියන 57.64 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන වියදම් කර තිබුණි.

(ඇ) වැය විෂයන් 10 ක් සඳහා 2016 වර්ෂයට අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් සියයට 25 සිට සියයට 76 දක්වා වූ පරාසයක් තුළ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද, ජනාධිපති කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ක් ඉක්මවූ රු. මිලියන 662.97 ක් වූ තැන්පතු, පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 3.4 බැරකම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 94(1) විධිවිධානයට පටහැනිව වැය විෂයන් 20 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු. මිලියන 64.91 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

2002 සැප්තැම්බර් 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ කාර්යසාධන වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට ප්‍රථම පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2017 ජූලි 18 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

ජනාධිපති කාර්යාලයේ වැය විෂය 01-2-6-3-2502 - සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ හා අධීක්ෂණය යටතේ ආයෝජන සඳහා වියදම් දැරීමට සලසා තිබූ ප්‍රතිපාදනවලින් රු. මිලියන 4.83 ක් එම අරමුණින් පරිබාහිරව විවිධ තැනැත්තන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා වැයකර තිබුණි.

## 3.7 කාර්යසාධනය

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් අතරින් පහත කාර්යයන් ඉටුකර නොමැති බව කාර්යසාධන වාර්තාව අනුව තහවුරු විය.

(අ) පසු අස්වනු හානිය අවම කිරීම හා සුරක්ෂිතතාවයට සහයවීම සඳහා පසු අස්වනු සුරක්ෂිත තාක්ෂණය, ගෘහස්ථ කළමනාකරණය, පසු අස්වනු හානිය අවම කිරීම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම හා පහසුකම් සැපයීම අපේක්ෂාකර තිබුණි. මේ සඳහා රු. මිලියන 20 ක් වැයකිරීමට අපේක්ෂා කර තිබුණද, එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව වස විසෙන් තොර ආහාර භෝග වගාව ප්‍රවර්ධනයට සහයවීම සඳහා රු. මිලියන 115 ක් වැය කිරීමට අපේක්ෂාකර තිබුණි. 2016 වර්ෂය අවසාන වනවිට භෝග වර්ග 11 ක් වගා කිරීමට හා කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු. මිලියන 59.35 ක් පමණක් වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, 'දරුවන් සුරකිමු' ජාතික වැඩසටහන යටතේ ළමා ආරක්ෂණය සඳහා කඩිනම් අවධානය යොමු කිරීම වෙනුවෙන් රු. මිලියන 120 ක හා අධිකරණ හා නීතිමය කරුණු සම්බන්ධයෙන් සංශෝධන ඇති කිරීම වෙනුවෙන් රු. මිලියන 40 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණද, එම කාර්යයන්හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු කාර්යසාධන වාර්තාවෙහි සඳහන් වී නොතිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලික |
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 163 | 56 | 67 | 23 | 07 | 73 |
| (ii) තෘතියික මට්ටම | 18 | 42 | 08 | 20 | 05 | 10 | 17 |
| (iii) ද්විතියික මට්ටම | 318 | 129 | 276 | 68 | 30 | 42 | 31 |
| (iv) ප්‍රාථමික මට්ටම | 619 | 144 | 312 | 27 | 30 | 307 | 87 |
| **එකතුව** | **1,018** | **478** | **652** | **182** | **88** | **366** | **208** |

ජ්‍යෙෂ්ඨ මට්ටමේ ස්ථිර තනතුරු 07 ක් ඇතුළුව ස්ථිර තනතුරුවල මුළු පුරප්පාඩු සංඛ්‍යාව 366 ක්ව පැවතීම ජනාධිපති කාර්යාලයේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් ඒවා පිරවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවයද, එසේ අහිතකර ලෙස බලනොපාන්නේ නම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයද අවධාරණය කරනු ලැබේ.